ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය

කොළඹ

# පුවත්පත් නිවේදනය

## <u>ඉන්දියානු නිවාස ව්‍යාපෘතිය යටතේ ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක 10ක් පුරා වතු 45ක නිවාස 1300 ක් ඉදිකිරීම ඇරඹේ</u>

ඉන්දීය මහ කොමසාරිස් සන්තෝෂ් ජා මහතා ඉන්දියානු නිවාස ව්‍යාපෘතියේ සිව්වන අදියර යටතේ ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක 10ක් පුරා වතු 45ක නිවාස 1300 ක් ඉදිකිරීම සමාරම්භ කිරීම සඳහා ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතා සමඟ අන්තර්ජාලය ඔස්සේ සම්බන්ධ විය. 2024 පෙබරවාරි 19 වන දින කොළඹ, ජනාධිපති ලේකම් කාර්යාලයේ පැවති මෙම උත්සවයට තවත් සම්භාවනීය අමුත්තන් රැසක් සහභාගී විය. ඉන්දීය නිවාස ව්‍යාපෘතියේ මෙම අදියර යටතේ ඉන්දීය රජය වතු කම්කරුවන් සඳහා නිවාස 10,000ක් ඉදි කරන අතර එම නිවාස ශ්‍රී ලංකාවේ පළාත් 6ක ඉදි කෙරේ.

2. ඉන්දියානු නිවාස ව්‍යාපෘතියේ සිව්වන අදියර පිළිබඳ නිවේදනය අග්‍රාමාත්‍ය නරේන්ද්‍ර මෝදි මහතා විසින් වතුකර ප්‍රදේශවල සිදු කළ සංචාරය අතරතුරදී සිදු කරන ලදී. මෙම අදියර සඳහා මුල්ගල ඉන්දීය මුදල් අමාත්‍ය ශ්‍රීමතී නිර්මලා සීතාරාමන් මහත්මියගේ ශ්‍රී ලංකා සංචාරය අතරතුරදී එතුමිය සහ ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතා විසින් අතථ්‍ය ආකාරයෙන් තබන ලදී.

3. ඉන්දීය නිවාස ව්‍යාපෘතිය යටතේ ඉන්දියානු රජය නිවාස 60,000ක් ඉදි කරනු ලබයි. පළමු අදියර දෙක යටතේ උතුරු සහ නැගෙනහිර පළාත්වල නිවාස 46,000ක් ඉදි කරන ලදී. තෙවන අදියර යටතේ වතු

කම්කරුවන් සඳහා නිවාස 4,000ක් ඉදි කරන අතර ඒවායේ ඉදිකිරීම් අවසාන අදියරේ පවතී.

4. ශ්‍රී ලංකාව සමඟ ඉන්දීය රජයේ සංවර්ධන සහයෝගීතාවය තුළ ඉන්දීය සම්භවයක් සහිත දමිළ ප්‍රජාවට සහ වතුකර ප්‍රදේශ වලට හිමිවන්නේ විශේෂ අවධානයකි. ප්‍රදාන ව්‍යාපෘතිවල පමණක් වටිනාකම ශ්‍රී ලංකා රුපියල් බිලියන 30කට අධිකය. නිවාස 14,000ට අමතරව සිදු කර ඇති තවත් සුවිශේෂී ව්‍යාපෘතියක් වන්නේ දික්ඔය බහු විශේෂඥ රෝහලයි. ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතාගේ 2023 ජූලි මස ඉන්දීය සංචාරය අතරතුර අග්‍රාමාත්‍ය නරේන්ද්‍ර මෝදි මැතිතුමා විසින් ඉන්දීය සම්භවයක් සහිත දමිළ ප්‍රජාව ශ්‍රී ලංකාවට පැමිණ වසර 200ක් සපිරීම නිමිත්තෙන් ශ්‍රී ලංකා රුපියල් බිලියන 3ක බහු අංශ පැකේජයක් නිවේදනය කරන ලදී.

***

***කොළඹ***
***2024 පෙබරවාරි 21***